සැකසුම -වයි.එම්.ශ්‍රියානි පෙරේරා
ර/තෙප්පනාව කුමාර මහා විද්‍යාලය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of

## කාර්ය පත්‍රිකාව -

- **නිපුණතාව 03** - **සාම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩ වල ස්වරූපය හඳුනා ගනිමින් වාදන කුසලතා ප්‍රදර්ශනය කරයි**
- **නිපුණතා මට්ටම 3.1** - **නිර්දේශිත වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ ශිල්ප ක්‍රම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි**
- **පාඩම** - **වාද්‍ය භාණ්ඩ සකස් කිරීම පිළිබඳ තොරතුරු විමසමු**

## I කොටස

**නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

(01) බෙර පෙර සැකසීමේදී කඳ මැදින් හිල් විදීම සඳහා යොදාගනු ලබන උපකරණය වනුයේ

(i) පත් උළ
(iii) උල් නියන
(ii) අවගාරය / යවකාරය
(iv) අතකොළුව

(02) පහතරට බෙරයෙහි සම්මත දිග ප්‍රමාණය වනුයේ

(i) එක් වියත් තුනගුලයි
(iii) විගුස්සයි
(ii) තුන් වියත් තුන් ගුලයි
(iv) සත් බඹ සත් වියතකි

(03) කුන්දිරම්පල්ල දක්නට ලැබෙන වාද්‍ය භාණ්ඩය වනුයේ

(i) රබාන
(iii) පොකුරු බෙරය
(ii) උඩැක්කිය
(iv) දවුල

(04) ගැටබෙරය සඳහා යොදා ගන්නා හම් වර්ගය වනුයේ

(i) වඳුරු හම්, තලගොයි හම්, එළු හම්
(ii) හරක් බොකු, එළු හම්
(iii) මුව හම්, එළහරක් හම්
(iv) තලගොයි හම්, මී වසු පැටවුන්ගේ හම්

(05) බෙර සැකසීමේ දී අතකොළුව භාවිත කරනුයේ

(i) බර කඳ ලියවීම සඳහා
(ii) ආයුධ මුවහත් කිරීම සඳහා
(iii) කඳ හැරීමේදී නියනට පහරදීම සඳහා
(iv) වර ඇද ගැනීම සඳහා

**හිස්තැන් පුරවන්න**

(01) නක්ෂත්‍ර නියමයන්ට අනුව ................................................ ගස කැපීම ද ................................................ භාණ්ඩයට හම් යෙදීම ද පැරැණි සම්මත සිරිත වේ.

(02) ගැට බෙරයෙහි ඇස වටා මැදින් ................................................ නමින් කුඩා ඉරක් මදක් ගැඹුරට කපනු ලැබේ.

(03) තම්මැට්ටම හෙවත් පොකුරු බෙරය ................................................ සහ ................................................ යනුවෙන් කොටස් දෙකකට වර්ග කෙරේ.

(04) සාම්ප්‍රදායික ප්‍රමිතියට අනුව දවුලේ දිග ................................................ පමණ වේ.

(05) තම්මැට්ටමේ මණ්ඩමෙහි විෂ්කම්භය ................................................ කි.

## II කොටස

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

(01) අදාළ වාද්‍ය භාණ්ඩ සැකසීම සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරන්න.

(02) වාද්‍ය භාණ්ඩ සැකසීමේ සම්මත ශිල්ප ක්‍රම හා චාරිත්‍ර පිළිබඳ විස්තර කරන්න.

(03) වාද්‍ය භාණ්ඩ සකස් කිරීමේ දී ධ්වනි ගුණය උත්පාදනයට අවශ්‍ය ශිල්ප ක්‍රම භාවිතයේ වැදගත්කම විචාරයට ලක් කරන්න.